පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.03.06 පැය 0800 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out /455/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

## පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

### 01. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - විශේෂ කාර්ය බලකා මොරටුව කඳවුර.

2025.03.05 වන දින උදෑසන කාලයේ මොරටුව පොලිස් වසමේ ලුනාව ප්‍රදේශයේදී විශේෂ කාර්ය බලකා මොරටුව කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නීති විරෝධී මත්පැන් ලීටර් 25 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මොරටුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරටුව පොලීසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

### 02. බලපත්‍ර නොමැතිව වැලි කණීම් කළ සැකකරුවෙකු අත්අඩංගුවට - විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුර.

2025.03.05 වන දින සවස් කාලයේ අක්කරපත්තුව පොලිස් වසමේ පූලාවලි සොරියනාරු ඇල අසල ප්‍රදේශයේ විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර බලපත්‍ර නොමැතිව අනවසරයෙන් වැලි කැණීම් කළ සැකකරුවෙකු, ට්‍රැක්ටර් රථයක්, වැලි සහ කැණීමට යොදා ගන්නා උපකරණ සමඟ අත්අඩංගුවට ගෙන අක්කරපත්තුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වන අක්කරපත්තුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

අක්කරපත්තුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - විශේෂ කාර්ය බලකා සියඹලාණ්ඩුව කඳවුර.

2025.03.05 වන දින සවස් කාලයේ දොඹගහවෙල පොලිස් වසමේ කොකාවිද්ද මඩයාය ප්‍රදේශයේදී විශේෂ කාර්ය බලකා සියඹලාණ්ඩුව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **ගංජ කිලෝ 44 ග්‍රෑම් 600 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන දොඹගහවෙල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 56 ක් වන ගලබැද්ද, මොණරාගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දොඹගහවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

වැටලීමට අදාල ඡායාරූපයක් මේ සමඟ යොමු කරමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**